# අතුරුදන් කෙරුණු අයගේ ප්‍රශ්නය සහ ජාතිවාදී උගුලෙන් ගැලවීම

අතුරුදන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත පිළිබඳ
පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ කියවීම



# අතුරුදන් කෙරුණු අයගේ ප්‍රශ්නය සහ ජාතිවාදී උගුලෙන් ගැලවීම

අතුරුදන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත පිළිබඳ
පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ කියවීම

**පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ ප්‍රකාශනයකි.**

# අතුරුදන් කෙරුණු අයගේ ප්‍රශ්නය සහ ජාතිවාදී උගුලෙන් ගැලවීම

අතුරුදන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත පිළිබඳ පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ කියවීම

---


ප්‍රථම මුද්‍රණය - 2016 සැප්තැම්බර්

පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ ප්‍රකාශනයකි.



අංක 41/32,
පළමු මාවත,
කැන්දහේනවත්ත පාර,
දෙපානම,
පන්නිපිටිය.
011 - 28 37 286
flsocialistparty@gmail.com



**මුද්‍රණය**
ස්පෙක්ට්‍රා ඇඩ්වර්ටයිසින්
සද්ධර්මතිලකාරාම මාවත,
ගෝනහේන,
කඩවත.



අතුරුදන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත’ නමින් අතුරුදන්වූවන් පිළිබඳව විමර්ශනය කිරීමේ පනතක් 2016 අගෝස්තු 23 වැනිදා කථානායකවරයා අත්සන් තැබීමත් සමග නීතිගත විය. එය 2016 මැයි 24 වැනිදා අගමැති රනිල් වික්‍රමසිංහ විසින් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන ලදුව කැබිනට් අනුමැතියට ලක්ව, ජුනි මස 22 වැනිදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද පනතකි. ඒ සඳහා වන ඡන්ද විමසීම අගෝස්තු 11 වැනිදා පාර්ලිමේන්තුවේ පැවැත්වුණේ ජාතිවාදී පදනමින් එල්ල කරන ලද ඒකාබද්ධ විපක්ෂයේ බරපතල විරෝධතා මධ්‍යයේය. පනත එදින ඡන්ද විමසීමට ලක් නොකළ යුතු බවත් ඒ සඳහා සංවාදයට සහ අධ්‍යනයට තවත් කල් අවශ්‍ය බවත් විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරුන්ගේ මතය විය. කෙසේ වෙතත් ආණ්ඩුවේ සිටින එක්සත් ජාතික පක්ෂයේත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේත් මන්ත්‍රීවරුන්ගේද විපක්ෂයේ සිටින දෙමළ ජාතික සන්ධානයේ සහ ජනතා විමුක්ති පෙරමුණේද සහය ඇතිව පනත සම්මත විය.

## අතුරුදන් කිරීම් සහ සමූහ ඝාතන

පනත නීතිගත වී තිබුණද මේ පිළිබඳව විශාල සංවාදයක් සමාජය තුළ ඇති වෙමින් තිබේ. අතුරුදන්වීම් පිළිබඳ ප්‍රශ්නය ලාංකේය සමාජයේ ප්‍රශ්නයකි. ලාංකේය ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් පිළිබඳ ප්‍රශ්නයකි. නමුත් පවතින සංවාදය තුළ ඒ සැබෑ ප්‍රශ්නයට හිමි වී ඇත්තේ කොපමණ කුඩා ඉඩ ප්‍රමාණයක්ද? පසුගිය කාලයේ විශාල

පිරිසක් විවිධ ආකාරයෙන් අතුරුදන් වී තිබේ. මේ අතුරුදන්වීම්වලින් වැඩිම ප්‍රමාණය සිදු වී ඇත්තේ රාජ්‍යයට සහ ආණ්ඩුකරණයට එරෙහි දේශපාලන මත දැරීම නිසා බවට විවාදයක් නැත. බලහත්කාරයෙන් අතුරුදන් කිරීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කණ්ඩායම (WGEID) පවසන ආකාරයට ඔවුන්ගේ වසර 35ක ඉතිහාසය තුළ ඔවුන් විසින් කටයුතු කර ඇති අතුරුදන් කිරීම් පිළිබඳ සිද්ධීන් අතරින් දෙවනුවට වැඩිම සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ ලංකාවෙනි. ඔවුන් විසින් තහවුරු කර ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය වෙත යොමු කර ඇති අතුරුදන් කිරීමේ සිද්ධීන් ගණන 12,341ක්ද රජය විසින් තහවුරු කර ඇති සිද්ධීන් ගණන 6,551ක්ද අනෙකුත් මූලාශ්‍ර මගින් තහවුරු කළ සිද්ධීන් 40ක්ද අමතර සිද්ධීන් 5,750ක්ද වේ. පසුගිය ආණ්ඩුව විසින් 2013 අගෝස්තු 15 වැනි දින ස්ථාපිත කරන ලද හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මැක්ස්වෙල් පරණගමගේ සභාපතිත්වයෙන් සහ සුරංජනා විද්‍යාරත්න සහ මනෝ රාමනාදන්ගේ සහභාගීත්වයෙන් යුත් 'අතුරුදන්වූවන් පිළිබඳ විමර්ශනය කිරීමේ විශේෂ ජනාධිපති කොමිෂන් සභාව' සිය වාර්තාව 2015 අගෝස්තුවේදී එළිදක්වා තිබේ. එයට අනුව කොමිසම වෙත ලැබුණු පැමිණිලි ගණන 18,476ක් වූ අතර යුද්ධය පැවති කාලයේ සමස්ත අතුරුදන්වීම් සංඛ්‍යාව 24,000ක් පමණ විය හැකි බව පැවසේ. රතු කුරුස සංවිධානය විසින් මේ වසරේ ජුලි මාසයේ නිකුත් කරන ලද වාර්තාවේ සඳහන් පරිදි ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර ප්‍රදේශවල අතුරුදන් සංඛ්‍යාව 16,000කට අධිකය. ඇම්නෙස්ටි ජාත්‍යන්තර ආයතනයට අනුව මෙම සංඛ්‍යාව 20,000ක් පමණ වේ. ඒ 1971දී අතුරුදන්වූ 20,000ට සහ 1987-1989 වකවානුවේ අතුරුදන් වූ 60,000ට අමතරවය. කෙසේ වෙතත් දහස් ගණනක් මේ අතුරුදන් කිරීම් සහ පැහැරගෙන යාම්වල ගොදුරක් වී ඇති බව පැහැදිලිය. මේ අතුරුදන් කිරීම්වලට ගොදුරු වූවන්ට සහ ඔවුන්ගේ සමීපතමයන්ට සාධාරණය ඉටු කළ යුතුය. එලෙස යුක්තිය ඉටු කිරීමේ පළමු ප්‍රමුඛතාවය විය යුත්තේ අතුරුදන්වූවන්ට අත් වූ ඉරණම පිළිබඳ තොරතුරු හෙළි කිරීමයි. ඒ සඳහා විනිවිද

පෙනෙනසුලු සාධාරණ විමර්ශනයක් අවශ්‍ය වේ. නමුත් සාධාරණය ඉටු කිරීම සඳහා එවැනි විමර්ශනයක් පමණක් ප්‍රමාණවත් නැත. ඒ සඳහා වන දීර්ඝ කාලීන පියවර පසුව සාකච්ඡා කිරීමට තබා අපි අවම වශයෙන් විමර්ශනය පිළිබඳව විමසා බලමු.

නමුත් මේ සම්මත කෙරෙන අණ පනත්වලින් එම සාධාරණය ඉටු කරගත හැකිද? මේ පනත්වල අරමුණ අතුරුදන්වූවන් පිළිබඳ සාධාරණ විමර්ශනයක් කර තොරතුරු සමාජයට හෙළිදරව් කිරීම සහ ඒවායේ වගකිවයුත්තන්ට එරෙහිව නීතිය ක්‍රියාවේ යෙදවීමද? එසේත් නැතිනම් මේ සිදුවන්නේ දේශපාලන බල ක්‍රීඩාවක්ද? මෙම ප්‍රශ්නයට පිළිතුරු සොයා ගැනීමෙන් තොරව මේ දිනවල නව පනත සම්බන්ධයෙන් දියත් කෙරෙන සංවාදයට මැදිහත් වීමේ අර්ථයක් නැත. මෙම විවාදයේදී ආණ්ඩුව පනත ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ගේ සුවිසල් ජයග්‍රහණයක් ලෙස හුවා දක්වන අතර ඒකාබද්ධ විපක්ෂයේ නමින් ක්‍රියාත්මක වන හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂගේ පිල මෙය 'රණ විරුවන් දඩයම් කිරීමේ උත්සාහයක්' ලෙස අර්ථ දක්වමින් ජාතිවාදී දේශපාලන ව්‍යාපෘතියක් ශක්තිමත් කිරීමට මෙම සංවාදය උපයෝගී කර ගැනීමට උත්සාහ කරමින් සිටී. විමසිලිමත්ව බලන විට පෙනී යන්නේ මෙම දෙපාර්ශවයම නිරතව සිටින්නේ සමාජය පිළිබඳ හෝ අපරාධ වින්දිතයන් පිළිබඳ වගකීම් විරහිත, පටු දේශපාලන බල තරගයක බවයි.

## ජාතිවාදී ව්‍යාපෘතිය

ඒකාබද්ධ විපක්ෂය තරගයට ඉදිරිපත් වෙමින් මේ පනතේ අරමුණ 'රණවිරු දඩයම' බව කියයි. ඔවුන්ගේ මෙම තර්කයට අනුව මෙම අතුරුදන්වීම් පසුපස ආරක්ෂක අංශ සිටින බවටත් අතුරුදන් කිරීම් පිළිබඳව කෙරෙන කවර හෝ විමර්ශනයකදී ආරක්ෂක අංශ ප්‍රමුඛ රාජ්‍ය නිලධාරීන් වරදකරුවන් විය හැකි බවටත් අනියමින් පිළිගෙන ඇත. මේ කණ්ඩායම පසුගිය කාලයේ ආණ්ඩු බලය හෙබවූ අය වීමත් මෑත කාලීන අතුරුදන්වීම්වලින් සාතිශය බහුතරය ඔවුන්

ආණ්ඩු බලයේ සිටියදී සිදු වූ ඒවාත් නිසා මෙම ප්‍රකාශ බැරෑරුම් ලෙස සැලකිල්ලට ගත යුතුය. මෙම අතුරුදන් කිරීම් පිටුපස සිටින්නේ රාජ්‍ය යාන්ත්‍රණ බවත් එම සිදුවීම් හුදු රාජ්‍ය නිලධාරීන්ගේ අභිමතය අනුව නොව දේශපාලන අධිකාරයේ දැනුවත්භාවය සහ නියෝග මත සිදු වූ බවත් මෙම ප්‍රකාශ හරහා තහවුරු වේ. එසේනම් ආරක්ෂක අංශවල හෝ වෙනත් අංශවල රාජ්‍ය නිලධාරීන්ට, විශේෂයෙන් පහල නිලවල නිලධාරීන්ට නොව ඒ සඳහා ඔවුන්ට අණ දුන් ඉහළ නිලධාරීන් සහ දේශපාලන බලධාරීන් හට මේ සම්බන්ධයෙන් පියවර ගත යුතුය. අනෙක් අතට යම් අපරාධයක් සිදුව තිබේනම් එය කරන ලද පුද්ගලයාගේ රැකියාව, එනම් ඔහු හමුදාවේ සේවය කරනවාද යන්න විශේෂයෙන් සැලකිල්ලට ගත යුතුයැයිද හමුදා නිලධාරීන්ට රටේ සාමාන්‍ය නීතියට පරිබාහිරව අපරාධ සිදු කිරීමේ හා ඒවායෙන් දඬුවම් නොලබා සිටීමේ විශේෂ හිමිකමක් ඇති බව ඒකාබද්ධ විපක්ෂයේ තර්කය වන අතර එය ඉතාම දුර්වල තර්කයකි. එමෙන්ම ශිෂ්ට සම්පන්න සමාජයකට අනුමත කළ නොහැකි ප්‍රජාතන්ත්‍ර විරෝධී හා මානව විරෝධී තර්කයකි. ඒ අනුව පැහැදිලි වන්නේ ඔවුන් මෙම ප්‍රශ්නය භාවිත කරන්නේ සිය බලය වෙනුවෙන් ජාතිවාදය වැපිරවීමටත් ඒ හරහා බල ව්‍යාපෘතියක් දියත් කිරීමටත්ය. අපට අනුව නම් කොරහේ කිඹුලන් මවන්නේ එම අරමුණෙනි. එබැවින් පසුගිය කාලයේ සිදුවූ සියලු මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ, සියලු රාජ්‍ය මර්දනයන් අමතක කර, ඒවායේ වින්දිතයන් හට යුක්තිය ඉටු කිරීමට ඇති මාර්ග වසා දැමීමේ, ඒ සඳහා ජාතිවාදය ඇවිලවීමේ පහත් පෙළේ දේශපාලනය පරාජය කළ යුතුය.

## සංදර්ශන දේශපාලනය

අනෙක් අතින් මෙහිදී ආණ්ඩුවේ මැදිහත්වීමේ ඇති දේශපාලන යටි අරුතද තේරුම් ගත යුතුය. ආණ්ඩුව අතුරුදන්වූවන් සඳහා විමර්ශනය කිරීමට නව නීති සම්මත කරන අතර එකිනෙකට පරස්පර කතා කියමින් සිටී. මේ පනත ගෙන ඒමේදී ආණ්ඩුව සමාජයට

පැවසුවේ අතුරුදන්වූවන් සම්බන්ධයෙන් සාධාරණය ඉටු කිරීමත් සත්‍ය විමර්ශනයක් සිදු කිරීමත් චූදිතයන්ට එරෙහිව නීතිය ක්‍රියාවේ යෙදවීමත් සිය අභිප්‍රාය බවය. නමුත් මේ වසරේ මැයි 24 වැනිදා මෙම පනත් කෙටුම්පතට අනුමැතිය ඉල්ලා සිටිමින් පිටු දෙකක අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් කළ අගමැති රනිල් වික්‍රමසිංහ එම සන්දේශයේ සඳහන් කර ඇත්තේ කුමක්ද? "**අතුරුදහන් පුද්ගලයන් පිළිබඳ කාර්යාලය විසින් හෙළි කරගන්නා තොරතුරුවලින් කිසිදු සාමාන්‍ය හෝ සාපරාධී හෝ වගකීමක් නොපැවරෙනු ඇත,**" යි එම යෝජනාවේ අවසන් පිටුවේ සඳහන් වෙයි. මෙම පනතේ අරමුණ අතුරුදහන් සම්බන්ධ කාරණා හමාරයකට ගෙන ඒම සහ ඔවුන්ට වන්දි හෝ වෙනත් සහන හා සහාය ලබා දීම පමණක් බවත් එම අමාත්‍ය මණ්ඩල සන්දේශයේ අගමැතිවරයාගේ අත්සනින් සඳහන් කර තිබේ. මේ අතර පනත් කෙටුම්පත් පිළිබඳ ඡන්ද විමසීම සිදු කළ අගෝස්තු 11 වැනිදා පාර්ලිමේන්තුවේදී විදේශ අමාත්‍ය මංගල සමරවීර පැවසුවේ මෙහි අරමුණ රජයේ හමුදාවන්ගේ කීර්ති නාමය ආරක්ෂා කර ආරක්ෂක අංශ නිදොස් කිරීම බවය. ''**ත්‍රිවිධ හමුදාව ආරක්ෂා කරමින් ජාත්‍යන්තර වශයෙන් ඔවුන්ගේ කීර්ති නාමය ගොඩනැඟීම මේ මඟින් සිදු වෙනවා. හමුදාවන්ට ජාත්‍යන්තරයට යා හැකි ලෙස සාම සාධක හමුදාවන්ට යා හැකි තත්වයට අපි නිර්මාණය කරනවා.**'' යනුවෙන් මංගල සමරවීර ඇමතිවරයා ප්‍රකාශ කළේය. ආණ්ඩුව මේ පනත සඳහා කැබිනට් අනුමැතිය දුන්නේ අතුරුදන්වීම් සම්බන්ධයෙන් විමර්ශනය කිරීමේ යාන්ත්‍රණයක් සඳහා යුද වින්දිතයන් දායක කර නොගැනීම සම්බන්ධයෙන් කනස්සල්ල පළ කරමින් උතුරු නැගෙනහිර පළාත්වල ප්‍රජාතන්ත්‍රවාදයට අදාළ සංවිධාන සහ ක්‍රියාධාරීන් සමූහයක් විසින් විදේශ අමාත්‍යවරයාට ලිපියක් ලියා සතියක් ගත වෙද්දීය. නිසි විමසුම් ක්‍රියාවලියකින් තොරව මෙවැනි කාර්යාලයක් පිහිටුවීම අනුමත කළ නොහැකි කටයුත්තක් ලෙසින් හඳුන්වන ඔවුන් පවසන්නේ යුද වින්දිතයන් හෝ

ඔවුන්ගේ සමීපතමයන් සම්බන්ධ කර නොගැනීම මගින් රජය යුක්තිය ඉටුකිරීමට අවංක කැපවීමක් නැති බව ප්‍රදර්ශනය කර ඇති බවයි.

මේ සියල්ලෙන් පෙනී යන්නේ ආණ්ඩුව මෙම පනත ගෙන ආවේ හුදු දේශපාලන සන්දර්ශනයක් සහ සාධාරණය ඉටු වන බවට ව්‍යාජ බලාපොරොත්තු ඇති කර අතුරුදන්වූවන්ගේ ඥාතීන් රැවටීමේ ක්‍රියාමාර්ගයක් ලෙස බවය. ආණ්ඩුව ප්‍රජාතන්ත්‍රවාදී අභිලාෂයන් ඇති බලවේගවලට එකකුත් ජාතිවාදී බලවේගවලට ඊට සම්පූර්ණයෙන්ම පරස්පර වෙනත් එකකුත් පැවසීමේ දෙබිඩි පිළිවෙත හෙළිදරව් කරන්නේ එම ව්‍යාපෘතියයි.

## කලින් කළ යුතු දේ

ආණ්ඩුවට යුද වින්දිතයන්ට සහ මර්දනයට ගොදුරු වූවන්ට සාධාරණය ඉටු කිරීමේ අවංක සහ අව්‍යාජ උත්සාහයක් ඇත්නම් එය මීට පෙර අවස්ථා ගණනාවකදී පෙන්විය හැකිව තිබිණි. උදාහරණයක් ලෙස අතුරුදන් කිරීම් සම්බන්ධ මෙතරම් කඩමුඩියක් පෙන්වන ආණ්ඩුව අනෙකුත් ප්‍රශ්න සම්බන්ධයෙන් අනුගමනය කර ඇත්තේ කවර ප්‍රතිපත්තියක්ද? දේශපාලන සිරකරුවන් පිළිබඳ ප්‍රශ්නය ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රධාන ප්‍රශ්නයකි. සියලු දේශපාලන සිරකරුවන් නිදහස් කරන ලෙස කාලයක් තිස්සේ පවතින උද්ඝෝෂණය සහ සමාජ මතය තමන්ගේ ඡන්ද ගොඩ වැඩිකර ගැනීම සඳහා පසුගිය ජනාධිපතිවරණයේදී සහ මහමැතිවරණයේදී යොදාගත් මේ ආණ්ඩුවේ නායකයන් බලයට පැමිණි පසු දේශපාලන සිරකරුවන් පිළිබඳ සාහසික ප්‍රකාශ සිදු කරමින් සිටී. ජනාධිපතිවරයාත්, අගමැතිවරයාත් අවස්ථා කිහිපයකදීම පැවසුවේ ලංකාවේ දේශපාලන සිරකරුවන් නොමැති බවය. දේශපාලන සිරකරුවන් හට සාධාරණය ඉටු කිරීම කෙසේ වෙතත් එවැන්නන් සිටින බව පිළිගැනීම පවා ප්‍රතික්ෂේප කරන ආණ්ඩුවක් එම ප්‍රශ්නයේම කොටසක් වන අතුරුදන් කිරීම් සම්බන්ධයෙන් සාධාරණය ඉටු කරනු ඇතැයි අපේක්ෂා කිරීම

යථාර්ථවාදී නැත. අනෙක, උතුරේ ජනතාවගෙන් පැහැරගත් ඉඩම් පිළිබඳ ප්‍රශ්නය, මිලිටරීකරණය පිළිබඳ ප්‍රශ්නය ආදී ප්‍රමුඛ ප්‍රශ්නවලට සම්පූර්ණ පිළිතුරු ලබා නොදී 'බාගෙට තැම්බුනු' විසඳුම් යෝජනා කරමින් සිටින ආණ්ඩුව අවම වශයෙන් යුද වින්දිතයන්ගේ ජන ජීවිත නගා සිටුවීමටවත් ගෙන ඇති ප්‍රමාණවත් පියවර මොනවාදැයි ප්‍රශ්න කළ යුතුය. එනිසා මේ අණ පනත් මගින් සාධාරණය සහ යුක්තිය අපේක්ෂා කිරීම ඉබ්බන්ගෙන් පිහාටු අපේක්ෂා කිරීමට වඩා ඥානවන්ත වන්නේ නැත.

## සාමාන්‍ය නීතිය සහ විශේෂ නීති

ආණ්ඩුව අතුරුදන් කිරීම් පිළිබඳ සාධාරණය ඉටු කිරීමට අපේක්ෂා කරන්නේ නම් නව නීති, නව යාන්ත්‍රණ නිර්මාණය කිරීමට පෙර දැනට තිබෙන නීති සහ යාන්ත්‍රණ ඒවායේ උපරිම සීමාව දක්වා සක්‍රිය කිරීමට උත්සාහ කළ යුතුය. නමුත් මේ ආණ්ඩුව පිළිබඳ මෙතෙක් අත්දැකීම වී තිබෙන්නේ පවතින නීතිය හෝ භාවිත කිරීම වෙනුවට අපරාධ වසන් කිරීමට මැදිහත් වීමේ අත්දැකීමයි. මේ සඳහා උදාහරණ ඕනෑ තරම් ඉදිරිපත් කළ හැකි අතර පක්ෂයක් ලෙස අපට ඒ පිළිබඳ අපගේම අත්දැකීම් ඇත. 2012 අප්‍රේල් 07 වැනිදා කුමාර් ගුණරත්නම් සහෝදරයා සහ දිමුතු ආටිගල සහෝදරිය පැහැරගෙන යාම තමන්ගේ අනුදැනුම සහ මෙහෙයවීම මත සිදු වූ දෙයක් බව එවකට සිටි ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් ගෝඨාභය රාජපක්ෂ 2015 නොවැම්බර් 08 දින 'සත්හඬ' ඉරිදා පුවත්පතට සම්මුඛ සාකච්ඡාවක් දෙමින් ප්‍රකාශ කළේය. අතුරුදන් කිරීම් සම්බන්ධයෙන් තමන් තොරතුරු දන්නා බවත් තමන් එයට සම්බන්ධ බවත් පුද්ගලයෙකු ප්‍රසිද්ධියේ ප්‍රකාශ කර තිබියදීත් පොලීසිය හෝ වෙනත් රාජ්‍ය ආයතනයක් ඊට අදාළව ක්‍රියාත්මක වූයේ නැත. ඒ සඳහා නව නීති හෝ අතුරුදන් කිරීම් පිළිබඳ විමර්ශනය කිරීමේ විශේෂ කාර්යාල අවශ්‍ය නැති අතර පවතින නීතිය පමණක් වුව ප්‍රමාණවත්ය. නමුත් පෙරටුගාමී සමාජවාදී පක්ෂය ඒ

සම්බන්ධයෙන් 2015 නොවැම්බර් 11පොලිස් මූලස්ථානයට පැමිණිලි කරන ලද අතර එයට පියවර නොගත් බැවින් 2015 දෙසැම්බර් 03 වැනිදා යළිත් පොලිස් මූලස්ථානයටම පැමිණිල්ලක් සිදු කරන ලදී. ඉන් අනතුරුව පොලීසිය වගකීම ඉටු නොකිරීම සම්බන්ධයෙන් 2016 ජනවාරි 07 වැනිදා මානව හිමිකම් කොමිසමටද පැමිණිලි කරන ලදී. එහෙත් මේ වනතුරු රාජ්‍ය ආයතන මේ පැහැර ගැනීම් සම්බන්ධ පවතින නීතියට අදාළවවත් විමර්ශනයක් දියත් කර නැත. තවත් උදාහරණයක් වන්නේ ලලිත් කුමාර් වීරරාජු සහ කුහන් මුරුග ානන්දන් යන සහෝදරවරු දෙදෙනා 2011 දෙසැම්බර් 10 වැනිදා යාපනයේදී අතුරුදන්වීම සම්බන්ධ අත්දැකීමයි. ඔවුන් දෙදෙනාගේ අතුරුදන්වීම පිළිබඳව තොරතුරු පසුගිය ආණ්ඩුවේ ඇමතිවරුන් වන කෙහෙළිය රඹුක්වැල්ල සහ මහින්දානන්ද අලුත්ගමගේ සතු බව පවසමින් පෙරටුගාමී සමාජවාදී පක්ෂය 2015 සැප්තැම්බර් 10 වැනිදා සහ 2016 ජනවාරි 05 වැනිදා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කළ මුත් ඒ සම්බන්ධයෙන්ද අවම වශයෙන් ප්‍රකාශ සටහන් කර ගැනීමක් පවා සිදු කෙරුනේ නැත. මේ අතර 2016 මැයි 13 වැනිදා යාපනය මහෙස්ත්‍රාත් අධිකරණයේදී සාක්ෂි ලබා දෙමින් හිටපු කැබිනට් මාධ්‍ය ප්‍රකාශක කෙහෙළිය රඹුක්වැල්ල පැවසුවේ ලලිත් සහ කුහන් අතුරුදන්වීම සම්බන්ධ තොරතුරු එවකට ආරක්ෂක අමාත්‍යාංශය දැන සිටි බවයි. එබැවින් ආරක්ෂක අමාත්‍යාංශයේ එවකට සිටි ප්‍රධානීන් කැඳවා මේ අතුරුදන්වීම් සම්බන්ධ විමර්ශනයක් සිදු කරන ලෙස 2016 අගෝස්තු 04 වැනිදා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යළිත් පැමිණිලි කළත් කිසිදු නීතිමය පියවරක් ඒ සඳහා ගෙන නැත. මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ අතුරුදන් කිරීම සම්බන්ධයෙන් විභාග වන නඩුවේදී චූදිතයන්ට රජයේ මුදලින් නීති ආධාර ලබා දීමට මේ ආණ්ඩුව කටයුතු කළ බවද සිහි තබා ගැනීම වැදගත්ය.

ආණ්ඩුව නව නීති සම්මත කරනුයේ මේ ආකාරයට අතුරුදන්

කිරීම් සම්බන්ධයෙන් සාමාන්‍ය නීතිය යටතේ පහසුවෙන්ම සිදු කළ හැකිව තිබූ විමර්ශන කටයුතු සිදු නොකෙරුණු තත්වයක් යටතේය. එබැවින් මෙම ක්‍රියාවලියේ සාධාරණත්වය පිළිබඳ පැහැදිලි සැකයක් තිබේ. අතුරුදන් කිරීම් සම්බන්ධයෙන් සාධාරණය ඉටු කිරීමටත් විමර්ශනය කිරීමටත් අපරාධ නඩු විධාන සංග්‍රහය වැනි සාමාන්‍ය නීති, පොලීසිය-අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වැනි රාජ්‍ය ආයතන පැවැති අතර ඊට අමතරව විශේෂ ආයතනද පිහිටුවා තිබිණි. නිදසුනක් ලෙස මනෝ තිත්තවැල්ල මහලේකම්වරයා ලෙස කටයුතු කරන සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය දැක්විය හැක. සත්‍යය, යුක්තිය, සංහිඳියාව සහ නැවත ගැටුම් ඇති වීම වැළැක්වීම සඳහා වූ කාර්යාලයක්, අධිකරණ යාන්ත්‍රණ කාර්යාලයක් සහ යුද පීඩිතයන්ට සහන සැලසීම සඳහා වන කාර්යාලයක් පවත්වාගෙන යාමේ වගකීම එය වෙත පවරා තිබෙන බව පැවසුවේ මේ ආණ්ඩුව විසින්මය. දැන් තවත් කාර්යාල යාන්ත්‍රණයක් පිහිටුවීමේ අරමුණ කුමක්ද? එය කුමක් වුවත් අතුරුදන්වීම් පිළිබඳ විමර්ශන සිදු කර වින්දිතයන්ට සාධාරණය ඉටු කිරීමේ අරමුණ නොවන බව පැහැදිලිය.

## පනතේ වතගොත

මේ නව පනතේ සැබෑ අරමුණු වටහා ගැනීමට ඇති ප්‍රධාන මාර්ගයක් වන්නේ පනත අධ්‍යයනය කිරීමයි. පනතට අනුව '**අතුරුදන් වූ තැනැත්තන් සෙවීම සහ ඔවුන් පිළිබඳව සොයා බැලීම සඳහා ද, අතුරුදහන් වූ තැනැත්තන්ගේ ඥාතීන්ට සහාය වීම සඳහා ද, අතුරුදන් වූ තැනැත්තන් පිළිබඳ දත්ත සමුදායක් ස්ථාපනය කිරීම සඳහා ද, ඉහත කී කාර්යාලයට පවරනු ලබන බලතල හා කර්තව්‍යවලට අදාළකාර්යපටිපාටි සහ මාර්ගෝපදේශ සකස් කිරීම සඳහා ද, මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ නැතහොත් ඊට ආනුෂංගික සියලු කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම සඳහාද**' අතුරුදන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයක් පිහිටුවනු ලබයි.

පනතේ 4(1) වගන්තියට අනුව මෙම කාර්යාලයට සාමාජිකයන් 7 දෙනෙකු ඇතුලත් වේ.

**'4. (1) (අ) ඕ.එම්.පී. ය සාමාජිකයන් හත් දෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර එම සාමාජිකයන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.'**

එම සාමාජිකයන් සංයුතිය කවරාකාරදැයි පනතේ සඳහන් කර නැත. එබැවින් මෙම කාර්යාලයට අතුරුදන්වූවන්ගේ ඥාතීන්, කාලයක් තිස්සේ අතුරුදන්වූවන් වෙනුවෙන් පෙනී සිටින සංවිධාන, ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් වෙනුවෙන් අරගල කරන දේශපාලන පක්ෂ, මානව හිමිකම් නීතීඥයන් වැනි පිරිස් නියෝජනය නොවනු ඇති අතර මෙම ප්‍රශ්න විකුණා ගෙන කන ජාවාරම්කරුවන්ගේ ප්‍රතිශතය ඉහළ යාමට නියමිතය. එමෙන්ම පනතේ සඳහන් අරමුණු අතිශයින්ම පටු අතර අවම වශයෙන් මෙකී අපරාධවලට නියෝග දුන් අයට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග පවා පැහැදිලිව දක්වා නැත. ඒ බව 2 වගන්තියෙන් පෙනේ.

**'2. පනතේ අරමුණු වනුයේ -**

**(අ) අතුරුදන් වූ තැනැත්තන් සෙවීම සහ ඔවුන් පිළිබඳව සොයා බැලීම සඳහා උචිත යාන්ත්‍රණ පිහිටුවීම සහ එම තැනැත්තන් අතුරුදන් වූ අවස්ථානුගත කරුණු සහ ඔවුන්ගේ ඉරණම පැහැදිලි කර ගැනීම,**

**(ආ) මේ පනතේ අර්ථානුකූලව අතුරුදන් වූ තැනැත්තන් පිළිබඳ සිද්ධීන් අඩුකිරීම සඳහා අදාළ බලධාරීන්ට නිර්දේශ ඉදිරිපත් කිරීමට,**

**(ඇ) මේ පනතේ විධිවිධාන සලසා ඇති පරිදි අතුරුදන් වූ තැනැත්තන්ගේ සහ ඔවුන්ගේ ඥාතීන්ගේ අයිතිවාසිකම් සහ බැඳියා ආරක්ෂා කිරීම සඳහා ද, සහ**

**(ඈ) අතුරුදන් වූ තැනැත්තන් හෝ ඔවුන්ගේ ඥාතින්ට**

**ප්‍රවේශ විය හැකි සහන ලබා ගැනීමේ නිසි මාර්ග හඳුනාගැනීමට**

**අවශ්‍ය සියලු පියවර ගනු ලබන බවට සහතික වීම වේ.'**

ඒ අනුව මෙම කාර්යාලය මගින් සිදු කෙරෙනුයේ විමර්ශන සිදු කිරීම සහ 'අධිකරණ කටයුත්තක් සිදු කෙරෙන අවස්ථාවකදී එම තොරතුරු ලබා දීම' පමණි. අධිකරණ කටයුතු සක්‍රිය කෙරෙන්නේ කවදාදැයි තීරණය කරන්නේ දැනටමත් මේ සිදුවීම් පිළිබඳ විමර්ශන ප්‍රමාද කරමින් සිටින පොලීසිය ඇතුළු ආයතන සහ ඒවාට මාර්ගෝපදේශනය සපයන ආණ්ඩුවයි. පනතේ 10(2) වගන්තියට අනුව කාල සීමාවකින් තොරව ඕනෑම කාලයකදී සිදු වූ අතුරුදන්වීමක් පිළිබඳ විමර්ශන කටයුතු සිදු කිරීමට එයට බලය ඇතිමුත් පනතේ 12 වගන්තියට අනුව ප්‍රමුඛතා දෙනු ලබන්නේ ඉතා මෑතක දී සිදු වූ පුද්ගලයන් අතුරුදහන් වීම පිළිබඳ සිද්ධීන්, දැනටමත් වැදගත් සාක්ෂි තිබෙන සිද්ධීන් සහ ඕ.එම්.පී. හි මතය අනුව මහජනතාවට වැදගත් වන සිද්ධීන් සඳහාය. එනිසා බොහෝ අත්‍යවශ්‍ය විමර්ශන මග හැරිය හැකි ප්‍රතිපාදන පනතේ අඩංගුය. එමෙන්ම මෙම පනතේ 'අතුරුදන්වූවන්' නිර්වචනය කර තිබෙන ආකාරයද ප්‍රශ්නකාරීය. පනතේ 27 වගන්තිය මෙසේය.

**'අතුරුදන් වූ තැනැත්තා" යන්නෙන්, යම් තැනැත්තකුගේ ඉරණම හෝ සිටින ස්ථානය සාධාරණ ලෙස නොදන්නා බවට විශ්වාස කරනු ලබන්නා වූ ද ඒ තැනැත්තා ගණනය නොවූ බවට සහ අතුරුදන් වූ බවට සාධාරණ ලෙස විශ්වාස කරනු ලබන්නා වූ ද**

**(අ) ක්‍රියාන්විතයේ දී අතුරුදන් වූ සන්නද්ධ හමුදාවල සාමාජිකයකු හෝ පොලීසියේ සාමාජිකයකු ඇතුළු උතුරු නැගෙනහිර පළාත්වල සිදු වූ සන්නද්ධ ගැටුම් අතරතුර හෝ එහි ප්‍රතිඵලයක් ලෙස නැතහොත් එම සන්නද්ධ ගැටුම්වලට පසුව "යුද්ධයේ දී අතුරුදන් වූ තැනැත්තකු"**

**ලෙස හඳුන්වනු ලබන තැනැත්තකු හෝ**

**(ආ) දේශපාලන නොසන්සුන්තාවයක් සම්බන්ධයෙන් හෝ සිවිල් කැරළි කෝලාහල සම්බන්ධයෙන් හෝ**

**(ඇ) බලහත්කාරයෙන් අතුරුදන් කිරීමෙන් ආරක්ෂා කිරිම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියේ සහ "සම්මුතියේ බලහත්කාරයෙන් අතුරුදන් කරවීම" යනුවෙන් අර්ථ නිරූපණය කර ඇත්තා වූ ද තැනැත්තකු අදහස් වේ"**

මෙමගින් පසුගිය කාලයේ කොළඹ නගරය ආශ්‍රිතව විශේෂයෙනුත්, සමස්තයක් ලෙස රට පුරාමත් පාතාලය, අපරාධකරුවන්, මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් ආදී ලෙස ලේබල් ගසා සිදුකරන ලද අතුරුදන්කිරීම් ආවරණය වේද යන්න සැක සහිතය. අනෙක මෙම කාර්යාලයේ නඩත්තුව සඳහා දේශීය සහ විදේශීය ආධාර සහ පරිත්‍යාග ගැනීමට පනත ඉඩකඩ සලසා තිබේ. පනතේ 21වන වගන්තිය මෙසේය.

**"21. දේශීය හෝ ජාත්‍යන්තර වශයෙන් ලැබෙන ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ඇතුළුව එහෙත් ඒවාට සීමා නොවන පරිදි ඕ.එම්. පී. හි අරමුණු ඉටු කර ගැනීම සඳහා අරමුදල් උපයා ගැනීමට ඕ.එම්.පී. ට බලය තිබිය යුතු ය."**

මේ ආකාරයට විවිධ අරමුදල් සහ පරිත්‍යාග සැපයීම හරහා මෙම යාන්ත්‍රණයට බලපෑම් කිරීමට දේශීය සහ විදේශීය ධනවතුන්ටත්, සංවිධාන වලටත් ඉඩ විවෘතව තබා තිබේ. එය ප්‍රශ්නයක් වන්නේ සාමාන්‍යයෙන් මෙවැනි දේශපාලන කර්තව්‍යයක් හෝ නෛතික කර්තව්‍යයක් වෙනුවෙන් පත් කරනු ලබන ආයතනවලට පොදු සමාජ අරමුදල් වලින් මුදල් වෙන් කරනවා මිස ඒවාට අරමුදල් සැපයීම හරහා මැදිහත්වීමට විවිධ පාර්ශවයන්ට ඉඩ සැලසීමේ සම්ප්‍රදායක් නැති හෙයිනි. ආණ්ඩුව මෙවැනි යාන්ත්‍රණ සම්බන්ධයෙන් දරන මූල්‍ය ප්‍රතිපත්තිය මෙයනම් අනාගතයේදී පොලීසියට සහ අධිකරණයටද පරිත්‍යාග ලබා ගැනීමේ අයිතිය ලබා දීමේ ඉඩක් තිබේ.

අනෙක් වැදගත් ප්‍රශ්නය වන්නේ මෙම පනත මගින් අතුරුදන්වූවන් පිළිබඳ සෙවීමේ කාර්යාලයට විවිධ ගිවිසුම් සඳහා එළඹීමේ ඉඩකඩ ලබා දීමයි. පනතේ 11(අ) වගන්තියට අනුව එයට විවිධ ගිවිසුම් ඇති කරගත හැක.

' 11. **ඕ.එම්.පී. ට පහත දැක්වෙන සාමාන්‍ය බලතල තිබිය යුතුය-**

**(අ) තොරතුරු ලබා ගැනීමේ දී සහාය ලබා ගැනීමේ කාර්යය සඳහා, තාක්ෂණික සහාය සහ පුහුණුව (අධිකරණ වෛද්‍ය හෝ අන්‍යාකාරයකින් වන) ලබා ගැනීම සහ සහයෝගය ලබා ගැනීමේ කාර්ය සඳහා, පෞද්ගලික දත්ත ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් දත්ත සමුදායක් පිහිටුවීමේ කාර්ය සඳහා සහ තොරතුරුවල රහස්‍යභාවය සම්බන්ධයෙන්, ගිවිසුම්වලට ඇතුළත් වීම ඇතුළුව දේශීය වශයෙන් හෝ විදේශීය සහ සංස්ථාගත කරන ලදුව හෝ එසේ නොමැති සංවිධානයක් හෝ යම් තැනැත්තකු සමග අවශ්‍ය යයි ඕ.එම්.පී.ට පෙනී යන අවස්ථාවල දී ගිවිසුම්වලට ඇතුළත්වීම**'

සාමාන්‍යයෙන් තාක්ෂණික කරුණු සඳහාත් සේවා සපයා ගැනීම සඳහාත් මෙවැනි ව්‍යූහයකට සාමාන්‍ය බලතල තිබෙන අතර ගිවිසුම්වලට එළඹීමේ බලයක් ව්‍යතිරේකයක් ලෙස ලබා දීමේ අරමුණ කුමක්දැයි ප්‍රශ්නයක් තිබේ. එනිසා මෙම පනතේ ඇති ප්‍රශ්නය වනුයේ ඒකාබද්ධ විපක්ෂය පවසන ආකාරයට හමුදා කඳවුරුවලට වරෙන්තු නොමැතිව ඇතුළු වීමේ බලය හෝ සාක්ෂි ආඥා පනතට පටහැනි සාක්ෂි පවා ලබා ගැනීමේ බලය ආදී බලතල මෙම කාර්යාලයට හිමිව තිබීම නොවේ. අතුරුදන්වූවන් සෙවීම සඳහා එවැනි බලතල අත්‍යවශ්‍ය අතර එවාවත් නොමැතිනම් මෙවැනි යාන්ත්‍රණ පිහිටුවීමේ පලක් නැත. ප්‍රශ්නය අප ඉහත දැක්වූ ආකාරයට මෙම යාන්ත්‍රණය සඳහා බාහිර

මැදිහත්වීම්වලට ඇති ඉඩකඩ උපරිම විවෘත කර තිබීමයි. එමෙන්ම මේ ප්‍රශ්නයට ඍජුව සම්බන්ධ පාර්ශව මේ තුළ නියෝජනය නොවීමයි. පනත ගෙන ඒමේදී ආණ්ඩුවේ අරමුණ අතුරුදන්වීම්වලට සාධාරණය ඉටු කිරීම නොව ලෝකයේ අනෙක් රටවලට සන්දර්ශනයක් ඉදිරිපත් කර ඒවායේ සහ අධිරාජ්‍යවාදී සංවිධානවල අනුමැතිය දිනා ගැනීමත්, ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් වෙනුවෙන් අරගල කරන ජනතා බලවේග රැවටවීමත් බව පැහැදිලිව පෙනේ.

## ප්‍රශ්නය කුමක්ද?

අතුරුදන්වූවන් හට යුක්තිය ඉටු කිරීමේ විසඳුම පිළිබඳව සාකච්ඡා කිරීමටනම් ප්‍රථමයෙන් ප්‍රශ්නය කුමක්දැයි සාකච්ඡා කළ යුතුය. ප්‍රශ්නය ලෙස මතුපිටින්ම පෙනෙන්නේ පුද්ගලයන් සතු ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් අහිමිවී ඔවුන් පැහැර ගැනීමට, ඝාතනය වීමට, වධ හිංසාවන්ට ලක්වීමට, අතුරුදන්වීමට ලක්වීමයි. මේ සම්බන්ධ අපට ඕනෑ තරම් උදාහරණ ලාංකීය සමාජයට ලැබී තිබේ. 1980 දශකයේදී අප අතුරුදන් කිරීම් පමණක් නොව, එසේ අතුරුදන් කෙරුණු අය වෙනුවෙන් අධිකරණය ඉදිරියේ හබයාස්කෝපුස් පෙත්සම් ගොනු කරමින් යුක්තිය ඉටු කිරීමට වෙහෙසුණු විජේදාස ලියනාරච්චි, සනත් කරල්ලියද්ද, කාංචන අබේපාල වැනි නීතීඥයන් පවා අතුරුදන් කිරීමේ අත්දැකීම් ලබා ගත්තෙමු. ඉන් අනතුරුව අප 2000 සහශ්‍රකයේ පළමු දශකයේදී උතුරේ සහ නැගෙනහිර දස දහස් ගණන් අතුරුදන්වනු පමණක් නොව ඒ අතුරුදන් කෙරුණු අය සෙවීමට, ඔවුන්ට යුක්තිය ඉටු කිරීමට ක්‍රියාකාරීවූ ලලිත් සහ කුහන් වැනි දේශපාලන ක්‍රියාධරයන්ද අතුරුදන් කිරීමට ලක්වනු අත්දුටුවෙමු. මෙලෙස අතුරුදන් කෙරෙන්නේ රාජ්‍යයට එරෙහිව දේශපාලනය කරන්නන් නිසා මේ අපරාධ පසුපස සිටින්නේ රාජ්‍යය බවට අමුතුවෙන් තර්ක කළ යුතු නැත. නිශ්චිතවම මේ අතුරුදන් කිරීම් පසුපස රාජ්‍ය මර්දන යාන්ත්‍රණයන් තිබේ.

එමෙන්ම මේ අතුරුදන් කිරීම් වියුක්ත ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ප්‍රශ්නයක් පමණක් නොවේ. එය පසුපස දේශපාලන කතාවක් තිබේ. පාලකයන් රාජ්‍ය මර්දන යාන්ත්‍රණ භාවිත කර අතුරුදන් කරවනු ලැබුවේ තමන් අත්විඳි සමාජ පීඩනයන් සහ සමාජමය අසාධාරණයන් ඉදිරියේ නිහඬව නොසිට ඊට එරෙහිව සටන් වැදුණු අයයි. මෙම පනත අතුරුදන්වීම් පිළිබඳව වියුක්තව සඳහන් කර පැලැස්තර විසඳුම් යෝජනා කර ඇතිමුත් මේ සැබෑ ප්‍රශ්නය පිළිබඳ කිසිදු සඳහනක් එහි නැත. එපමණක් නොව මේවායේ අරමුණ එම සැබෑ ප්‍රශ්නය වසන් කිරීමයි. පුද්ගල අතුරුදන් කිරීම්වලට හේතුව රාජ්‍ය බලහත්කාරය සහ රාජ්‍ය මර්දනයයි. රාජ්‍ය මර්දනයට හේතුව රාජ්‍යයට එරෙහිව විවිධ ජනතා බලවේග නැගී සිටීමයි. එය එක්කෝ වැඩකරන ජනතාව ප්‍රමුඛ සමාජයේ පීඩිත ජනතාව පීඩාවෙන් පීඩාවට පත් කරන සමාජ-ආර්ථික ප්‍රතිපත්තියට එරෙහි නැගී සිටීමකි. නැතිනම් එම සමාජ-ආර්ථික ප්‍රතිපත්තියට සමාජ අනුමැතිය ලබා ගැනීම සඳහා පාලකයන් උපක්‍රමිකව භාවිත කරන ජාතිවාදයේ ප්‍රතිපලයක් ලෙසය. එම අරගලයේ දේශපාලනය පිළිබඳ කවර නොඑකඟතා පැවතියද උතුරේ සිදුවූයේද ජාතික පීඩනයට එරෙහි නැගී සිටීමක් බව පැහැදිලිය.

එක පැත්තකින් අතුරුදන් කිරීම්ද ඇතුළු ප්‍රජාතන්ත්‍රවාදයට අදාළ ප්‍රශ්නවල මූලය වන්නේ නව ලිබරල් සමාජ-ආර්ථික ප්‍රතිපත්තියයි. එම ප්‍රතිපත්තියට ජනතා විරෝධය ගොඩනැගෙන විට එය අඛණ්ඩව ක්‍රියාත්මක කළ හැක්කේ මර්දනය හරහා විරුද්ධ වන බලවේග නිහඬ කරවීමෙනි. පසුගිය කාලයේ පැවති අනෙකුත් ආණ්ඩු මෙන් වර්තමාන ආණ්ඩුවද එම ජනතා විරෝධී ප්‍රතිපත්තියම අනුගමනය කරන නිසා හුදු පනත් සම්මත කිරීමෙන් හෝ කාර්යාල පිහිටුවීමෙන් මෙම ප්‍රශ්නය විසඳිය නොහැකි බවත්, එවැනි ක්‍රියාමාර්ග හුදු අස්බැන්දුමකින් ඔබ්බට නොයන බවත් අපගේ විශ්වාසයයි. මේ ආණ්ඩුවද දිගටම ගමන් කරන්නේ මේ මාර්ගයේනම් කුමන කාර්යාල පැවතියද අතුරුදන් කිරීම් ඇතුළු ප්‍රජාතන්ත්‍රවිරෝධී ක්‍රියාවන්ට පෙළඹීම වැළක්විය නොහැකි වනු

ඇත. එමෙන්ම ප්‍රශ්නය සඳහා පිළිතුරක් සම්පාදනය කළ හැක්කේද, සැබෑ පිළිතුරු ව්‍යාජ පිළිතුරුවලින් වෙනකොට හඳුනාගත හැක්කේද මෙම පදනම මත පිහිටමිනි.

## ව්‍යාජ විසඳුම්

අපට දැන් එක් එක් දේශපාලන කේන්ද්‍රයන් විසින් අතුරුදන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත භාවිත කරමින් පිවිස සිටින දේශපාලන පදනම් සහ උපක්‍රම පිළිබඳව සාකච්ඡා කළ හැක. මුලින්ම මේ පනත ඉදිරිපත් කළ, එය ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ගේ ඓතිහාසික ඉදිරි පියවරක් ලෙස පාරම්බාන ආණ්ඩුවේ දේශපාලන ප්‍රවේශය වෙත අවධානය යොමු කළ හැක. ආණ්ඩුව මේ පනත හරහා උත්සාහ කරන්නේ අතුරුදන්කිරීමට ලක්වූවන්ට සාධාරණය ඉටු කිරීමට නොව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිෂන් සභාව ඇතුළු අධිරාජ්‍යවාදී සංවිධානත් ඇමෙරිකා එක්සත් ජනපදය-එක්සත් රාජධානිය-යුරෝපා රටවල් ඇතුළු පාර්ශව සතුටු කිරීමටය. මෙය ලෝකය වෙනුවෙන් ඉදිරිපත් කෙරෙන සරුවපිත්තල සංදර්ශනයක් සහ ලංකාවේ ජනතාවට අදාලව රැවටිල්ලක් මිස සැබෑ ප්‍රජාතන්ත්‍රවාදී උත්සාහයක් නොවේ. ආණ්ඩුව මේ පාර්ශව සතුටු කිරීමට උත්සාහ ගන්නේ එම රටවල පාලකයන්ගේ අනුග්‍රහය යටතේ ණය, ආධාර සහ ආයෝජන ආකර්ෂණය කර ගැනීමටය. පසුගිය ආණ්ඩුව මෙන්ම වත්මන් ආණ්ඩුවද අනුගමනය කරන කොල්ලකාරී නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්තිය සඳහා මෙම උපකාර අවශ්‍ය වන අතරම එම ජනතා ද්‍රෝහී-විනාශකාරී ආර්ථික වැඩපිළිවෙළ සුජාතකරණය කළ හැක්කේද මෙවැනි ව්‍යාජ ප්‍රජාතන්ත්‍රවාදී සළුපිළි පෙරවීමෙනි. ආණ්ඩුව මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක කරන්නේ නම් ඊට එරෙහිව ජනතා විරෝධය පැන නැගීම අනිවාර්ය වන අතර මීට පෙරද දශක කිහිපයකට පෙර අතුරුදන් කිරීම් ආරම්භ කරනු ලැබුවේ එකී විරෝධයන් මැඩලීමටය. ඒ අනුව ආණ්ඩුවේ ගමන් මාර්ගය විසින් ඉටු

කරන්නේ අතුරුදන් කිරීම් අවසන් කිරීමේ දේශපාලන සංස්කෘතියක් නිර්මාණය කිරීම නොව එවැනි ක්‍රියාමාර්ග සඳහා පසුබිම නිර්මාණය කරන වැඩපිළිවෙළක් ශක්තිමත් කිරීමය. ආණ්ඩුවේ පනත් මගින් කරන්නේ උගුලෙන් ගැලවීමට තැත් කරන මුවාවෙන් උගුලේ තව තවත් පැටලීමය. අධිරාජ්‍යවාදී ආර්ථික සැලැස්ම ශක්තිමත් කිරීම සඳහා, අධිරාජ්‍යවාදීන්ගේ අනුග්‍රහය වෙනුවෙන් කරන සන්දර්ශනවලින් ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත නොවනවා පමණක් නොව දිගු කාලීනව එය අනතුරට ලක්වේ.

අධිරාජ්‍යවාදීන් ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ වෙනුවෙන් පෙනී සිටින බවට ඇති වැරදි මතයද මෙහිදී සැලකිල්ලට ගත යුතුය. වත්මන් ලෝකයේ දේශපාලන-ආර්ථික-මිලිටරිමය බල කේන්ද්‍ර කිහිපයක් නිර්මාණය වී ඇති අතර ඒවා අතර අන්තර්-අධිරාජ්‍ය ප්‍රතිවිරෝධයක් පවතී. මෙම ප්‍රතිවිරෝධය මතත්, අධිරාජ්‍යවාදී ප්‍රාග්ධන උවමනා මතත් පදනම් වූ භූ-දේශපාලන න්‍යාය පත්‍ර සෑම අධිරාජ්‍යවාදී රටකටම පවතින අතර විශේෂයෙන් ඉන්දීය සාගරයේ බලය වෙනුවෙන් මෙකී න්‍යාය පත්‍ර තියුණු ආකාරයක් ගනී. අධිරාජ්‍යවාදීන්ගේ මැදිහත්වීම ලංකාවට අදාළව සිදුවන්නේ මෙම තත්වය තුළය. ලංකාවේ පමණක් නොව ලොව බොහෝ රටවල ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ප්‍රශ්නවලට අධිරාජ්‍යවාදීන් මැදිහත් වන්නේ සිය දේශපාලන උපායමාර්ගික සැලසුම් මත මිස ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් ඇති කැපවීමක් නිසා නොවේ. ලංකාවේ උදාහරණය ගත්තද මහින්ද රාජපක්ෂ පාලන සමයේදී මේ බොහෝ රටවල් හඬ නැගූ යුද්ධයේදී සිදු වූ මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ, දේශපාලන සිරකරුවන්, මර්දන නීති, අතුරුදන්වූවන්, දේශපාලන ඝාතන ආදිය සම්බන්ධයෙන් දැන් ඔවුන් අනුගමනය කරන ප්‍රතිපත්තිය මෙයට හොඳ නිදසුනකි. ආණ්ඩු මාරු වූ විගසම ඔවුන්ගේ ප්‍රතිපත්තිද මාරුවී තිබේ. ලංකාවේ දේශපාලන සිරකරුවන් නැතැයි එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ කොමසාරිස්වරයා මෑතකදී ලංකාවට පැමිණි

අවස්ථාවේදී කළ ප්‍රකාශය මෙම අංශක 180 හැරීම නිරූපණය කරන්නකි.

ඒකාබද්ධ විපක්ෂය මෙහිදී අනුගමනය කරන්නේ තමන්ට බලය ලැබෙනවානම් සමාජය කුමන ව්‍යසනයකට ලක්වූවත් කම් නැතැයි සිතන විනාශකාරී දේශපාලන ප්‍රවේශයයි. අධිකරණ බලතල නොමැති, හුදු විමර්ශන බලතල පමණක් ඇති, බොහෝ දුරට ආණ්ඩුවට අවශ්‍ය සිදුවීම් කිහිපයකට පමණක් විමර්ශන සීමා වී අනෙකුත් සිදුවීම් කාලයේ වැලි තලාවේ සැඟවීමට නියමිතව තිබෙන යාන්ත්‍රණයක් සම්බන්ධයෙන් යක්ෂ මුහුණක් පෙන්වීමේ අරමුණ බල පොරයම මිස වෙනෙකක් නොවේ. ප්‍රශ්නය වන්නේ එමගින් ජාතිවාදය පෝෂණය වී, සිංහල-දෙමළ සමාජ අතර පරතරය තවත් වර්ධනය වී සමාජය ලෙස අප මහා ආගාධයකට ඇද වැටීමයි. මෑත කාලයේ උතුරේ සහ නැගෙනහිර සිදුවූ අතුරුදන් කිරීම්වලට හේතුව ජාතික පීඩනයට එරෙහිව පැනනැගුනු අරගලය ජාතිවාදී යුද්ධයක් දක්වා වර්ධනය වීමයි. එම ප්‍රශ්නයේ මූලය ජාතිවාදයයි. එනිසා ජාතිවාදය තවත් වර්ධනය කරන දේශපාලනයකින් සිදු වන්නේ ප්‍රශ්නය විසඳා, අතීතයට යුක්තිය ඉටු කිරීම නොව ප්‍රශ්නය අනාගත පරම්පරාවන්ටත් උරුම කිරීමයි. එනිසා ඒකාබද්ධ විපක්ෂයේ ප්‍රවේශයද රෝගය උග්‍ර කරවන, වෙනත් අමතර රෝග බෝ කරන ඖෂධයකි.

පාර්ලිමේන්තුවේදී මේ පනතට අත එසවූ අනෙකුත් බලවේග ගැනද කෙටියෙන් හෝ සඳහන් කළ යුතුය. දෙමළ ජාතික සන්ධානය කරන්නේ දෙමළ ජනතාවගේ ප්‍රශ්නය මුළුමනින්ම ගසාකමින් එය සිය දේශපාලන බලය වෙනුවෙන් කළමනාකරණය කිරීමය. ප්‍රශ්නය විසඳීම නොවේ. මේ වනවිට දෙමළ ජාතික සන්ධානය කරන්නේ ඒ සියලු ප්‍රශ්න ආණ්ඩුවේ පැවැත්මේ සීමාවට කප්පාදු කර සැබෑ විසඳුමෙන් තවදුරටත් උතුරේ සමාජය දුරස් කරවීමයි. මීට හොඳම නිදසුන දේශපාලන සිරකරුවන්ගේ ප්‍රශ්නයට අදාළව දෙමළ ජාතික සන්ධානය ඉදිරිපත් කළ යෝජනාවයි. අනාගත සහජීවනයක් සහ

ප්‍රතිසන්ධානයක් වෙනුවෙන් පොදු සමාවක් ලබාදී සියලු දේශපාලන සිරකරුවන් වහා නිදහස් කරන ලෙස පැවැති සටන් පාඨය මුළුමනින්ම පාවා දුන් ඔවුන් යෝජනා කළේ චෝදනා නැති අය නිදහස් කර, චෝදනා ඇති අයට වහා නඩු පවරන සහ ඇප ලබා දිය හැකි චෝදනා තිබෙන අයට ඇප ලබාදෙන දියාරු යෝජනාවකි. එය අමුතුවෙන් යෝජනා කළ යුතු දෙයක් නොව ආණ්ඩුව තමන් ප්‍රජාතන්ත්‍රවාදී බව කියන්නේ නම් අනිවාර්යයෙන් ඉටු කළ යුතු පූර්ව කොන්දේසියකි. දැන් ඔවුන් අතුරුදන් කිරීමට ලක්වූවන්ගේ ප්‍රශ්නය රාජ්‍ය යාන්ත්‍රණයකට ලඝු කර රාජ්‍ය යාන්ත්‍රණ මගින් මර්දනය කරනු ලැබුවන්ට සාධාරණය ඉටු කළ හැක්කේ රාජ්‍ය යාන්ත්‍රණ හරහාමය යන මිත්‍යා විශ්වාසය වෙත දෙමළ සමාජය දක්කමින් සිටී.

ජනතා විමුක්ති පෙරමුණ සිය දේශපාලන වැඩපිළිවෙළ වමේද-දකුණේද, සමාජ ප්‍රජාතන්ත්‍රවාදීද-ජාතිකවාදීද යන්න තෝරා නොගෙන රැවුලත්-කැඳත් දෙකම බේරීමට ගොස් දෙළොවක් අතර සිටී. තමන්ගේ ප්‍රධාන දේශපාලන සටන්පාඨය ප්‍රජාතන්ත්‍රවාදය බව වේදිකාවල පැවසුවද ජනතා විමුක්ති පෙරමුණ යුද වින්දිතයන්ගේ කිසිදු ප්‍රශ්නයක් හෝ ප්‍රජාතන්ත්‍රීය අයිතියක් වෙනුවෙන් පෙනී සිටින්නේ නැත. දේශපාලන සිරකරුවන් හෝ අතුරුදන්වූවන් සම්බන්ධයෙන් ඔවුන් කිසිදු මැදිහත්වීමක් කළේද නැත. ආණ්ඩුව හා එය පදනම් වූ බලවේග සමග පවතින එකඟතාවන්ට අනුව පාර්ලිමේන්තුවේදී අතුරුදන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනතට පක්ෂව ඡන්දය දුන් ජනතා විමුක්ති පෙරමුණ ඉන් අනතුරුව තමන් 'රටට එරෙහි කිසිදු ක්‍රියාමාර්ගයකට සහය නොදෙන' බවද, 'රණවිරුවන්ට අත තැබීමට ඉඩ නොදෙන' බවද කියමින් ජාතිවාදී බලවේග තුලනය කිරීමට උත්සාහ කරයි. එය ඔවුන්ගේ දේශපාලන වැඩපිළිවෙළෙහි සුළු ධනේශ්වර චපල ස්වභාවය මැනවින් ප්‍රදර්ශනය කළ අවස්ථාවකි. තමන් අතුරුදන්වූවන් වෙනුවෙන් පෙනී සිටින බව පෙන්වන අතරම අතුරුදන් කිරීම්වල වගඋත්තරකරුවන් වෙනුවෙන්ද පෙනී සිටින බව

පෙන්වීමට සිදුව ඇති නිසා අවසානයේදී ඒ වෙනුවෙන් රෝහණ විජේවීර සහෝදරයාගේ ඝාතනය පිළිබඳ විමර්ශනද එයට පටලවා ගනිමින් සිටී. මෙවැනි බංකොලොත් සහ අස්ථාවර දේශපාලනයක් හරහා මෙවැනි සංකීර්ණ ප්‍රශ්නයක් කිසිසේත්ම විසඳිය නොහැක.

## විසඳුම කුමක්ද?

අපගේ ස්ථාවරය වන්නේ අතුරුදන්වූවන්ට සම්පූර්ණ සාධාරණය ඉටු කළ යුතු බවය. ඒ සඳහා වන අවම මූලික පියවර වශයෙන් අතුරුදන්වීම් පිළිබඳ සියලු සත්‍යය සමාජයට අනාවරණය කළ යුතුය. ඒ සඳහා පළමුව කළ යුත්තේ විධිමත් විමර්ශන ආරම්භ කිරීමයි. එහිදී මෙම අතුරුදන් කිරීම්වලට වගකිව යුතු රාජ්‍ය යාන්ත්‍රණ පිළිබඳව විශ්වාසය තැබිය නොහැකි අතර විමර්ශන සඳහා පුළුල් සමාජ මැදිහත්වීමක් අවශ්‍යවේ. ක්‍රියාවලිය සමාජයට විවෘත කෙරෙන පාරදෘශ්‍ය ක්‍රියාවලියක් විය යුතුය. එවන් අරමුණක් සාක්ෂාත් කරගත හැක්කේ අතුරුදන්වූවන්ගේ ඥාතීන් ඇතුළු මේ අයිතිය වෙනුවෙන් පෙනී සිටින සියලු දෙනාගේ පුළුල් අරගල ව්‍යාපාරයක් ගොඩනැගීම අවශ්‍ය වේ. විශ්වාසය තැබිය හැක්කේ එවැන්නකින් ඇති කරන තෙරපුම පිළිබඳව මිස අණ පනත් හරහා ස්ථාපිත කෙරෙන රාජ්‍ය යාන්ත්‍රණ පිළිබඳව නොවේ. එමෙන්ම අතුරුදන්කිරීම් පිළිබඳ ප්‍රශ්නය හුදෙකලා කර නොගෙන එය යුද්ධය හරහා බිඳ වැටුණු සමාජ බැඳීම් ශක්තිමත් කරන පුළුල් සහජීවන වැඩපිළිවෙළක් සමග සම්බන්ධ කළ යුතුය. එනම් සියලු ජන කොටස්වලට සම අයිතිය සහ ප්‍රජාතන්ත්‍රවාදය ඉල්ලා සිටින ජාතිවාදයට සහ ජාතික පීඩනයට එරෙහි ව්‍යාපාරයක සංයුක්ත වැඩපිළිවෙලකට අතුරුදන් වූවන්ගේ ප්‍රශ්නය ඇතුළු කළ යුතුය.

සියලු දේශපාලන සිරකරුවන් නිදහස් කිරීමට, මර්දන නීති අහෝසි කිරීමට, මිලිටරීකරණය අවලංගු කිරීමට, ජනතාවගෙන් උදුරා ගත් ඉඩම් සහ දේපළ යළි ලබා දීමට, යුද වින්දිතයන්ගේ ජීවිත යථා

තත්වයට ගොඩනැගීමට, යුද්ධයෙන් ඉතිරි වූ සරණාගතයන්ගේ, වැන්දඹුවන්ගේ, දෙමව්පියන් අහිමි ළමුන්ගේ ප්‍රශ්නවලට කඩිනම් විසඳුම් ලබා දීම, යුද්ධයෙන් හානි වූ සියල්ලන්ට වන්දි ලබා දීම ආදී වශයෙන් වන සටන්පාඨ සමග අතුරුදන් කිරීම්වලට එරෙහි සටන්පාඨය ඒකාබද්ධ කළ යුතුය. එපමණක් නොව දේශපාලන-සංස්කෘතික-සමාජමය වශයෙන් අසමානතාව ගොඩනගන සියලු අගතීන් මුලිනුපුටා දැමීම වෙනුවෙන් සම අයිති අරගලයක් වෙත සිංහල-දෙමළ-මුස්ලිම් සියලු ජනතාව එක්සත් කළ යුතුය. විසඳුම ඇත්තේ එවැනි දේශපාලන උපායමාර්ගයක පමණි. පෙරටුගාමී සමාජවාදී පක්ෂය සම අයිතිය ව්‍යාපාරය හරහා ජාතිවාදයටත් ජාතික පීඩනයටත් එරෙහි සියලු බලවේග සමග එක්ව ඒ සඳහා අරගල කරමින් සිටින අතර ආණ්ඩුවේ නව ලිබරල් උගුලටත් - ජාතිවාදීන්ගේ අසමගියේ උගුලටත් හසුවීම වෙනුවට සමානාත්මතාවයේ සහ ප්‍රජාතන්ත්‍රවාදයේ පදනම මත පුළුල් ජනතා ක්‍රියාකාරීත්වයක් ගොඩ නැගීම වෙනුවෙන් පෙනී සිටිය යුතුය. විසඳුම ඇත්තේ එතැනය.



# අතුරුදන් කෙරුණු අයගේ ප්‍රශ්නය සහ ජාතිවාදී උගුලෙන් ගැලවීම

## අතුරුදන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත පිළිබඳ පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ කියවීම

සියලු දේශපාලන සිරකරුවන් නිදහස් කිරීමට, මර්දන නීති අහෝසි කිරීමට, මිලිටරීකරණය අවලංගු කිරීමට, ජනතාවගෙන් උදුරා ගත් ඉඩම් සහ දේපළ යළි ලබා දීමට, යුද වින්දිතයන්ගේ ජීවිත යථා තත්වයට ගොඩනැගීමට, යුද්ධයෙන් ඉතිරිවූ සරණාගතයන්ගේ, වැන්දඹුවන්ගේ, දෙමව්පියන් අහිමි ළමුන්ගේ ප්‍රශ්නවලට කඩිනම් විසඳුම් ලබා දීම, යුද්ධයෙන් හානිවූ සියල්ලන්ට වන්දි ලබා දීම ආදී වශයෙන් වන සටන්පාඨ සමග අතුරුදන් කිරීම්වලට එරෙහි සටන්පාඨය ඒකාබද්ධ කළ යුතුය. එපමණක් නොව දේශපාලන, සංස්කෘතික, සමාජමය වශයෙන් අසමානතාවය ගොඩනගන සියලු අගතීන් මුලිනුපුටා දැමීම වෙනුවෙන් සම අයිති අරගලයක් වෙත සිංහල-දෙමළ-මුස්ලිම් සියලු ජනතාව එක්සත් කළ යුතුය. විසඳුම ඇත්තේ එවැනි දේශපාලන උපායමාර්ගයක පමණි.

ආධාරය රු. 50.00

**පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ ප්‍රකාශනයක්**

**අංක 41/32, පළමු මාවත, කැන්දහේනවත්ත පාර, දෙපානම, පන්නිපිටිය**